Discovery Series®

## දෙවියන් වහන්සේ මට

# පිළිතුරු නොදෙන්නේ ඇයි?





# දෙවියන් වහන්සේ මට පිළිතුරු නොදෙන්නේ ඇයි?

ඔබ දෙවියන්වහන්සේ සමග කථා කරන්නේද? ඔබගේ ප්‍රශ්න ගැටළු උන්වහන්සේ සමග බෙදා ගනිමින් උන්වහන්සේගේ උපකාර ඉල්ලා සිටින්නේද? බොහෝ දෙනා මෙම තත්ත්වය නොදකිති. ඔබ දෙවියන්වහන්සේගෙන් ඇතැම් දෑ ඉල්ලා, උන්වහන්සේ ප්‍රතිචාර නොදක්වන අවස්ථාවන්හී, දෙවියන්වහන්සේ විද්‍යාමාන නොවන බව හෝ විද්‍යාමාන වුවද ඔබ ගැන තැකීමක් නොකරන බව හෝ ඇතැම් විට ඔබ සිතනවා වන්නට පුළුවන.

මෙම ගැටළුව පිළිබඳවම අරගලයක යෙදෙන අයගේ බොහෝ යාච්ඤා බයිබලයේ අන්තර්ගත වන බව දැනගත් විට ඔබ මවිතයට පත්වීමට ඉඩ තිබේ. ආසාප් නැමැත්තා විසින් රචිත ගීතාවලිය 77 එවැනි යාච්ඤාවකි. දෙවියන්වහන්සේ ආසාප් ගැන නොසළකා හරින බව පෙනී යාමෙන් ඔහු කලකිරීමට පත්වීමට ආසන්නව සිටි බව අපි දකිමු. නමුත් යාච්ඤාව අවසානයේ කලකිරීමේ සිටි දෙවියන්වහන්සේ කෙරෙහි දැඩි විශ්වාසයක් ඇති කරගන්නා තත්ත්වයකට ඔහු පත්වන්නේය. එය කෙසේ සිදුවූයේද? එය දැන ගැනීමට අපි යාච්ඤාව පදයෙන් පදය විග්‍රහ කර බලමු.



# ගිතාවලිය 77:1-12

1 මාගේ හඬින් දෙවියන්වහන්සේට, එසේය,
මාගේ හඬින් දෙවියන්වහන්සේට මොරගසන්නෙමි.
උන්වහන්සේ මට කන් දෙන සේක.
2 දුක් ඇති දවසේදී ස්වාමීන් සෙව්මි. රාත්‍රියේදී මාගේ අත
නොනැවතී දිගුකර තිබුණේය. මාගේ ආත්මය සැනසෙන්ට
අකමැති විය.
3 මම දෙවියන්වහන්සේ සිහිකොට චංචලව සිටිමි. මම
මෙනෙහි කරමි. මාගේ ආත්මයද ශෝකයෙන් පිරී ගියේය.
4 ඔබ මාගේ ඇස්වලින් නින්ද වළක්වන සේක. කථාකරන්ට
බැරි තරම් කැළඹී සිටිමි.
5 මම පුරාණයේ දවස්ද පූර්ව කාලවල අවුරුදුද කල්පනා
කෙළෙමි.
6 රාත්‍රියේ මාගේ ගීතිකාව සිහිකොට, මාගේම සිත සමග කථා
කරමි. මාගේ ආත්මයද ඕනෑකමින් විමසුවේය.
7 ස්වාමින්වහන්සේ සදාකාලේටම පහකරන සේක්ද? තවත්
කරුණා නොකරන සේක්ද?
8 උන්වහන්සේගේ දයාව සහමුලින්ම පහව ගියේද?
උන්වහන්සේගේ පොරොන්දුව සදාකල් ඉෂ්ට නොවන්නේද?
9 දෙවියන්වහන්සේ කරුණාකරන්ට මතකනැති කළ සේක්ද?
කෝපයෙන් ස්වකීය දයාව වැළැක්වූ සේක්ද?
10 එවිට මම කථා කොට : මේ මාගේ දුර්වලකමය. නුමුත්
මහෝත්තමයාණන්ගේ දකුණතේ අවුරුදු සිහිකරන්නෙමි.
11 ස්වාමින්ගේ ක්‍රියා සඳහන් කරන්නෙමි ; මක්නිසාද ඔබගේ
පුරාණ ආශ්චර්යයන් සිහිකරන්නෙමි.
12 ඔබගේ කර්මාන්ත සියල්ල ගැන භාවනා කරන්නෙමි.
ඔබගේ ක්‍රියා ගැන මෙනෙහි කරන්නෙමියි කීයෙමි.

— ගීතාවලිය 77:1-12

අපබොහෝ දෙනා දෙවියන්වහන්සේට කථා කරන විට **කරන** පරිදි ආසාප් සිය අවශ්‍යතාව ප්‍රකාශ කරමින් සිය යාච්ඤාව ආරම්භ කරයි. ඔහු "දුකෙන්" "සැනසෙන්නට අකමැත්තෙන්" (2වන පදය) දෙවියන්වහන්සේ වෙතට පැමිණෙයි. ඇතැම් විට ඒ, දෙවියන්වහන්සේ පැමිණ ඔහුගේ තත්ත්වය සමථයකට පත් කිරීම ඔහුට අවශ්‍ය වූ බැවින් වන්නට පුළුවන. ආසාප්ගේ ගැටළුව කුමක්දැයි අප නොදන්නා නමුත් ආසාප් කණස්සලු වී සිටි බව අපට පැහැදිළිය.

අප සියලු දෙනාම දුෂ්කර කාලවල් හා තත්ත්වයන් මැදින් ගමන් කරන්නෙමු. කෙනෙකුට වේදනාවෙන් තොර ජීවිතයක් ඇති බව සිතීම යථාර්ථවාදී නොවේ. එසේ වුවත් අපද ආසාප් මෙන් අපගේ කරදරවලදී මෙසේ සිතිය හැක දෙවියන්වහන්සේ වෙත යන විට අපට උපකාර ලැබේවිද නැතිනම් අවසානයේ එය වඩාත් සංකීර්ණ වනු ඇද්ද? දයාවන්ත හා කරුණාවන්ත වීමට දෙවියන්වහන්සේ මතක නැති කළ සේක්දැයි සිතූ ආසාප් හට ඔහුගේ තත්ත්වය තවත් නරක අතට හැරී තිබෙන බව පෙනී ගියේය (8-9 පද). දෙවියන්වහන්සේගේ නිහඬ බව මධ්‍යයේ තමාට කිසිදු පිළිතුරක් හෝ බිය සැක දුරු කිරීමක් නොලැබෙන බව ආසාප් දැන ගත්තේය.

**ස්වාමින්ගේ ක්‍රියා සඳහන් කරන්නෙමි; මක්නිසාද ඔබගේ පුරාණ ආශ්චර්යයන් සිහිකරන්නෙමි**



# යාච්ඤා කිරීමේ අරමුණ

"අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවහොත් (උන්වහන්සේගේ අරමුණු සහ චරිතයට අනුව) උන්වහන්සේ අපේ ඉල්ලීම අසන සේක" යයි 1 යොහාන් 5:14 න් අපව ධෛර්යමත් කරන බැවින් ආසාප් තමාට අවශ්‍ය දෑ ඉල්ලීම නිවැරදිය. එසේම "මේ දක්වා මාගේ නාමයෙන් නුඹලා කිසිවක් ඉල්ලුවේ නැත. නුඹලාගේ ප්‍රීතිය සම්පූර්ණ වන පිණිස ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබෙන්නේය" (යොහාන් 16:24) යයි යේසුස් වහන්සේ ස්වකීය ගෝලයින්ට පැවසූ සේක. අපගේ සියලුම ඉල්ලීම් හා අවශ්‍යතා උන්වහන්සේ වෙතට රැගෙන ඒම උන්වහන්සේ අපේක්ෂා කරන සේක. නුමුත් යාච්ඤාවේ මූලික පරමාර්ථය එය නොවේ.

යාච්ඤාව තමාගේ ගැටළු විසඳනු ඇති බව ඇතැම් විට ආසාප් සිත්නට ඇත. එසේ නමුත් යාච්ඤා කරන්න යයි දෙවියන්වහන්සේ අපට පවසන විට, කිරීමට අවශ්‍ය දේවල් ලැයිස්තුවක් උන්වහන්සේ අපේක්ෂා නොකරන සේක; පිළිවෙත් ක්‍රමයක් හෝ ධර්මානුකූල තාක්ෂණ ක්‍රමයක්ද උන්වහන්සේ අපේක්ෂා නොකරන සේක. උන්වහන්සේට අවශ්‍ය අප උන්වහන්සේ සමග කථා කිරීම (සැබෑ යාච්ඤාව එයයි) හා වෙනත් සම්බන්ධතාවලදී මෙන් උන්වහන්සේ දැන හැඳින ගැනීමයි.

යාච්ඤාව වට්ටෝරුවක් බව අපි බොහෝ විට සිතන්නෙමු. දෙවියන්වහන්සේගෙන් උපකාර ඉල්ලීම උන්වහන්සේගෙන් ගැටළු විසඳන්නාවූ මවිතකර විසඳුමක්

**අප වෙනත් සම්බන්ධතාවලදී මෙන් දෙවියන්වහන්සේ සමග කථා කිරීම, උන්වහන්සේ හඳුනා ගැනීම උන්වහන්සේ අපේක්ෂා කරන සේක**

ලැබීමට සමානය. එම අදහස සිතේ දරාගෙන ආසාප් " දෙවියන්වහන්සේ මට පිළිතුරු නොදෙන්නේ ඇයි?" යන ප්‍රශ්නය විමසමින් අවසන් කරයි (ගීතාවලිය 77:7-9).

අපද ඒ ප්‍රශ්නයම විමසන්නට ඇත. අපගේ යාච්ඤාවේ අරමුණ අපට "අවශ්‍ය සියලු දේ" ලබා ගැනීම නම් එවිට අප සැම විටම දෙවියන්වහන්සේ අප පිළිබඳ සැළකිලිමත් නොවන්නේදැයි සිතමින් කලකිරීමට පත්වනු ඇත. අපගේ ඉල්ලීම් සියල්ලම දෙවියන්වහන්සේ ඉටු කරන බව (අප සිතන ආකාරයට) සිතන්න. එසේ නම් ලෝකය ක්ෂණයකින් ව්‍යාකූල භාවයට පත්වනු ඇත! අන් අයගේ ප්‍රතිවිරුද්ධ යාච්ඤා සමග අපගේ අවශ්‍යතා අතර ගැටුමක් හා සට්ටනයක් වීම ඇති වන්නේය.

ප්‍රශ්න, සැකය හා නිහඬතාව ආසාප් හට අවසානයේ මෙම නිගමණයට පැමිණීමට මග පෙන්වීය : "දෙවියන්වහන්සේ කරුණා කරන්ට මතක නැති කළ සේක්ද?" (9 වන පදය). වෙනත් වචනයකින් පවසන්නේ නම්, "මම මුළු රාත්‍රිය පුරා යාච්ඤා කළෙමි. දෙවියන්වහන්සේ කිසිවක් නොකළ සේක. ඇත්තේ එක අවසානයයි. දෙවියන්වහන්සේ විශ්වාසවන්ත නැත. මා රැකබලා ගන්නේ කෙසේදැයි උන්වහන්සේට අමතකවී ගොසිනි. උන්වහන්සේ කෙරෙහි මට බලා සිටිය නොහැක" යයි කීමකි.

එම සිතිවිල්ල සමග සම්පූර්ණයෙන් දෙවියන්වහන්සේ කෙරෙහි වූ බලාපොරොත්තුව අත් හැරීමට ඇති හැකියාවට ආසාප් මුහුණ දුන්නේය. විශ්වාසය තැබිය නොහැකි දෙවි කෙනෙක් කෙරෙහි විශ්වාසය තැබීමේ අර්ථය කුමක්ද?



# ආසාප් කරන්නේ කුමක්ද?

**හදිසියේම,** නොසිතූ පරිදි ආසාප් තම යාච්ඤාවේ ප්‍රතිපත්තිය ආපසු හරවන්නේය. 11 වන පදයේ මෙසේ සඳහන් වේ. "ස්වාමින්ගේ ක්‍රියා සඳහන් කරන්නෙමි". හදිසියේ ඔහුගේ බිය සහ සැකය මතට දෙවියන්වහන්සේ කෙරෙහි ඇති විශ්වාසයේ හැඟීමක සෙවණැලි වැටෙන්නේය. එවිට සිදුවූයේ කුමක්ද?

අපි එය පැහැදිලි කර ගනිමු. ආසාප්ගේ සැකය මවිතකර ලෙස අතුරුදහන් වූයේ නැත. ඔහුට හදිසියේ අදහසක් ඇතිවූයේ හෝ ආත්මික විදුලි බුබුලක් දැල්වෙනු දුටුවේ හෝ නැත. ආසාප් ඉතා සරළ නමුත් වැදගත් යමක් කර තිබේ ඔහු තමාගේ ඉලක්කය තමා වෙතින් දෙවියන්වහන්සේ වෙතට එසවූයේය. ඔහු තවත් තම කරදර ප්‍රශ්න පිළිබඳව දෙවියන්වහන්සේ සමග කථා නොකරයි, දැන් ඔහු දෙවියන්වහන්සේ ගැන උන්වහන්සේට කථා කරයි. මේ ආකාරයට කථා කරමින් දෙවියන්වහන්සේ කවුරුන්ද, තමාගේ ජීවිතය තුළ හා ශුද්ධ ලියවිල්ලේ පිටු අතර උන්වහන්සේ කර ඇත්තේ මොනවාද යන්න ඔහු තමාටම සිහිපත් කරගන්නේය.

අප සැක කරන දෑ පිළිබඳව බිය විය යුතු නොවේ; ඒවා දෙවියන්වහන්සේගෙන් සැඟවිය යුතු නොවේ. අපගේ සැක සහ අනාරක්ෂිත බව දෙවියන්වහන්සේ තේරුම් ගන්නා සේක. නුමුත් අපට කරදර ඇති අවස්ථාවන්හි අපගේ දුර්වලතා කෙරෙහි නොව උන්වහන්සේ කෙරෙහි ඉලක්ක කර ගැනීම උන්වහන්සේට අවශ්‍යය. ආසාප් තුළ වූ සැකය ඔහු තුළ බලාපොරොත්තු සුන්වීම ඇති කළේය. නමුත් ඔහු දෙවියන්වහන්සේ පිළිබඳව සිතීම ආරම්භ කළ විට හා දෙවියන්-වහන්සේ කවුරුන්ද යන්න සිහිපත් කිරීමට හා උන්වහන්සේ පිළිබඳව ශුද්ධ ලියවිල්ල පවසන්නේ කුමක්ද යන්න දෙස බැලීම ආරම්භ කළ අවස්ථාවේ ඔහු ධෛර්යවත් විය. නැවුම් බවක් ලැබුවේය.

අපි අවංක වෙමු. අපට කරදරයක් පැමිණි අවස්ථාවල සාමාන්‍යයෙන් අප අවසානයට කරන්නේ යාච්ඤාවයි. අපි

යාච්ඤා කරන විට අපි ආසාප් කළ දෑ කරමින් උන්වහන්සේ විසඳිය යුතු කාරණා සියල්ල දෙවියන්වහන්සේට ඉදිරිපත් කරමු. නමුත් 11 වන පදයේ සඳහන් පරිදි අප යාච්ඤාව ආසාප් දුටු ආකාරයෙන් දැකිය යුතුය. උන්වහන්සේ හොඳින් දැන ගැනීම පිණිස එය උන්වහන්සේ සමග සංවාදයේ යෙදීමකි. දෙවියන්වහන්සේ අප උදෙසා කර ඇත්තේ මොනවාද, අප උදෙසා ඉදිරියේදී කරන්නේ මොනවාද, අපට දී ඇති පොරොන්දු මොනවාද හා අප කවුරුන් වන පිණිස අපව මවා ඇද්ද යන කරුණු අප සිහිපත් කරන විට, දෙවියන්වහන්සේ කවුරුන්ද යන්න තුළ අපගේ විශ්වාසය වර්ධනය කර ගැනීමට කාලය එළඹී ඇත. ඉලක්කය සම්පූර්ණයෙන්ම උන්වහන්සේ කෙරෙහිය.

අප පිළිබඳව හා අපගේ ගැටළු පිළිබඳව යාච්ඤා කිරීම අප ආරම්භ කළහොත් යාච්ඤාව යනු කුමක්දැයි අපි සීමා කරන්නෙමු. අපගේ දර්ශනයේ අප පිළිබඳව පමණක් වන ලෙස කොටු කරන්නෙමු. යාච්ඤාව දෙවියන්වහන්සේ පිළිබඳව පමණක් නම්, අපි එවිට අපගේ කරදර ගැන පමණක් කථා කිරීම අරඹන්නේ නම්, තවදුරටත් ඒවා අපගේ දර්ශනයේ මධ්‍යස්ථානය නොවන්නේය. ඒවා අතුරුදහන් වන බව හෝ විසඳෙන බව හෝ ඉන් අදහස් නොවේ. නමුත් අප ගැන බලාපොරොත්තු තබා නොගෙන දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තබා සිටින බැවින් අපට ඒවා සමග ගනුදෙනු කිරීමේ හැකියාව ඇති බව ඉන් අදහස් වේ.

දෙවියන්වහන්සේ පිළිතුරු නුදුන්නේ මන්ද? දෙවියන්වහන්සේ නිහඬව සිටින්නේ මන්දැයි අප බොහෝ විට නොදන්නෙමු. කෙසේ වෙතත්, ආසාප්ගේ කථාන්තරයෙන් අපට ඉගෙන ගත හැකි එක් දෙයක් ඇත. ඒ ඔහුගේ ඉලක්කය ඔහු වෙතින් දෙවියන්වහන්සේ වෙතට හැරවීමට අවශ්‍යව තිබූ කාලය දෙවියන්වහන්සේගේ නිශ්ශබ්දතාව තුළින් ලැබුණු බවය. ආසාප් හට එය වේදනාකාරී වුවද, දෙවියන්වහන්සේ වෙතට ඔහු වඩාත් සමීප කරගැනීමට උපකාරයක් විය. එය අප උදෙසා දෙවියන්වහන්සේට අවශ්‍ය ප්‍රථම හා ප්‍රමුඛ කාරණය වේ. අප උන්වහන්සේ දැනගැනීම හා උන්වහන්සේට සමීප වීම උන්වහන්සේට අවශ්‍යය. අපගේ ගැටළුවලට උන්වහන්සේ ක්ෂණික විසඳුම් දුන්නේ නම්, අප උන්වහන්සේ දැන ගැනීමට සොයනු ඇද්ද? උන්වහන්සේ සමග අප ගත කරන කාලය කෙටි වනු ඇත. අප උන්වහන්සේව ගැටළු නිරාකරණය කරන්නාවූ "විකුණුම් යන්ත්‍රයක්" ලෙස පමණක් දැන සිටිනු ඇත.



# ගීතාවලිය 77:13-20

*13 දෙවියන්වහන්ස, ඔබගේ මාර්ගය ශුද්ධස්ථානයෙහිය.*
*දෙවියන්වහන්සේ මෙන් උතුම් දෙවි කෙනෙක් කවුද?*
*14 පුදුම දේ කරන දෙවියන්වහන්සේ නම් ඔබය.*
*ඔබ මනුෂ්‍ය වර්ගයන් අතරේ ඔබගේ ශක්තිය දැක්වූ සේක.*
*15 ඔබ යාකොබ්ගේද යෝසෙප්ගේද පුත්‍රයන් වන*
*ඔබගේ සෙනඟ ඔබගේ බාහුවෙන් මුදාගත් සේක.*
*16 දෙවියන්වහන්ස, ජලධාරාවෝ ඔබ දුටුවෝය.*
*ජලධාරාවෝ ඔබ දැක භය වූවෝය.*
*ගැඹුරු තැන්ද සෙලවුණෝය.*
*17 වලාකුල් දිය වැගිරෙවුවෝය; අහස ශබ්දයක් නික්මවීය.*
*ඔබගේ ඊගස්ද විහිද ගියේය.*
*18 ඔබගේ ගර්ජනා ශබ්දය සුළි සුළඟෙහි විය;*
*විදුලිද ලෝකය ආලෝක කෙළේය.*
*පොළොව සෙළවී කම්පා වූවාය.*
*19 ඔබගේ මාර්ගය මුහුදේ විය. ඔබගේ මාවත්*
*මහත් ජලධාරාවන්හි විය. ඔබගේ පා සලකුණු ප්‍රකාශ නොවීය.*
*20 ඔබ මෝසෙස් හා ආරොන් ලවා බැටළු රැළක් මෙන්*
*ඔබගේ සෙනඟ ගෙන ගිය සේක.*

**ආසාප් තමාගේ සිතිවිලි රටාව වෙනස් කළ** විට හා දෙවියන්වහන්සේ පිළිබඳව දෙවියන්වහන්සේ සමග සාකච්ඡා කිරීම ආරම්භ කිරීමත් සමග ඔහු පිළිබිඹු කරගත්තේ හා සිතුවේ කුමක්ද?

**දෙවියන්වහන්සේගේ ගැළවීමේ ක්‍රියා,** දෙවියන්වහන්සේ අතීතයේදී උන්වහන්සේගේ සෙනඟ මුදාගත් ආකාරය (15 වන පදය) ආසාප් සිහිපත් කරයි. යම් දෙයක් ගැළවීම යනු එය ආපසු මිළදී ගැනීම හෝ එහි අයිතිය යළි ලබා ගැනීමය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ කරදරවලින් හෝ සතුරන්ගෙන් බේරා ගෙන උන්වහන්සේගේ ආරක්ෂාව යටතට රැගෙන ආ අවස්ථාව ආසාප් සිහිපත් කරයි.

කිතුණුවන්ටද දෙවියන්වහන්සේගෙන් ඇත්ව හා විනිශ්චය

ලැබීමට සුදුසු ජීවිතයකින් ඔවුන් නිදහස් කළ අන්දම ගැන සිහිපත් කළ හැකිය. දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ අප දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම උදෙසා මිළක් ගෙවීම පිණිස මෙලොවට පැමිණි අවස්ථාව සිහිපත් කිරීමට පුළුවන. අප සියලු දෙනාම, අපට රිසි දේ කරමින් දෙවියන්වහන්සේ වැදගත් නොවන ආකරයේ ජීවිත ගත කරමු. "පාපය" යනු එයයි.

"අප උන්වහන්සේ තුළ දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම වන පිණිස පාපයක් නොදත්තාවූ උන්වහන්සේ අප වෙනුවට පාපය වෙන්ට (දෙවියන්වහන්සේ) සැළැස්වූ සේක (2 කොරින්ති 5:21). පාපය නොදත්තාවූ උන්වහන්සේ, එනම් යේසුස්වහන්සේට අපගේ පාප උදෙසා වූ වගකීම පියවූ දෙවියන්වහන්සේ පැවරූ සේක. අප නිදහස් වන පිණිස (නැවත දෙවියන්වහන්සේ වෙතට රැගෙන එමින්) අප වෙනුවෙන් උන්වහන්සේ පාපය උදෙසා වන්දි ගෙවූ සේක. අප වෙනුවෙන් මිය යන පිණිස යේසුස් වහන්සේ කුරුසපත් කරනු ලැබූ සේක. යේසුස්වහන්සේ අප වෙනුවෙන් කුරුසපත්වී මිය ගොස් නව ජීවිතයකට නැගිටවනු ලැබූ සේක. දෙවියන්වහන්සේ සමග මෙම නව ජීවිතයට එක් වීමට යේසුස්වහන්සේ අප සියලු දෙනා හට ආරාධනා කරන සේක.

ආසාප්ගේ යාච්ඤාවට දෙවියන්වහන්සේගේ මිදීම සැබෑ හැරවුම් ලක්ෂය වූ පරිදි දෙවියන්වහන්සේ සමග අපගේ සංවාදයන්ටද එය කේන්ද්‍රීය ලක්ෂයක් වන්නේය. "ඔබගේ සෙනඟ ඔබගේ බාහුවෙන් මුදාගත් සේක" (ගීතාවලිය 77:15) යයි අප පවසන විට අප දෙවියන් වහන්සේ කෙරෙහි කොපමණ බලාපෙරොත්තු තබා ගන්නේදැයි අපට සිහිපත් විය යුතුය. අපට යළිත් අපගේ ශක්තියෙන් හෝ හැකියාවෙන් උනවහන්සේට අයිති විය නොහැකිය. අප උන්වහන්සේට අයත් වන්නේ යේසුස්වහන්සේ කර ඇත්තේ මොනවාද යන්න මත බලාපොරොත්තු තබා ගෙන හා උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා ගැනීමෙනි. අප දෙවියන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු තබා ගනිමින් හා උන්වහන්සේට සමීප වෙමින් සෑම දිනකම පරීක්ෂාවන්ට මුහුණ දෙමින් අප ජීවත් විය යුතු වන්නේ ඒ අකාරයටය.

**දෙවියන්වහන්සේගේ උසස් බව** දෙවියන්වහන්සේගේ ගැළවීමේ ක්‍රියාවට බද්ධවී ඇති තම ජීවිතවල දෙවියන්වහන්සේ කර ඇති බොහෝ දෑ පිළිබඳව දෙවියන්වහන්සේගේ උසස් බව, බලය හා ශක්තිය කිතුණුවන් හට පිළිබිඹු කිරීමට හැකියාව තිබේ. ඔවුන්ට යේසුස්වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම් හා ක්‍රියා

පිළිබඳව බයිබලය තුළින් බැලීමට හැකියාව ඇත. උන්වහන්සේ දෙවියන්වහන්සේගේ මුළු "පූර්ණකමය" (කොලොස්සි 1:15, 19). උන්වහන්සේගේ ශක්තිය හා ප්‍රේමය පිළිබඳවද කියවීමට පුළුවන. කිසිවකට යේසුස්වහන්සේ පරාජය කිරීමට හෝ යටත් කර ගැනීමට නුපුළුවන් විය. "ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නුමුත් ධෛර්යවත් වෙයල්ලා. මම ලෝකයෙන් ජයගතිමි"යි (යොහාන් 16:33). යේසුස්වහන්සේ ගෝලයන්ට පැවසූ සේක. අපව බියට පත්කරවන බලවේග ශා බලයන් දෙවියන්වහන්සේ-ගේ ආඥාවන්ට යටත්ය. ඔබ බියට පත්වන දෑ උන්වහන්සේට බිය වෙති.

"නමුත් යේසුස්වහන්සේ කුරුසිය මත ඝාතනය කෙරුණා. ඒ අනුව උන්වහන්සේ යමකින් එනම් මරණය මගින් පරාජය කරනු ලැබුවා" යයි ඔබ සිතීමට පුළුවන. ඇත්තෙන්ම යේසුස්ව-හන්සේගේ මරණය, අප ගළවන පිණිස වූ දෙවියන්වහන්සේගේ සැළසුම විය. එපමණක් නොව, දින තුනකින් යේසුස්වහන්සේ සොහොන් ගෙයින් පිටතට පැමිණි සේක. යේසුස්වහන්සේ මරණය ඇතුළු සෑම සතුරෙක්ම පරාජය කළ සේක. අපි කුමන කරදරයක් තුළින් යන්නෙමු නමුත් ඒ තුළින් අප පිටතට ගෙනෙන බවට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට අපට හැකියාව තිබේ.

ස්වභාව ධර්මය පවා දෙවියන්වහන්සේට අයත් බව ආසාප් වටහා ගනී. "වළාකුල් දිය වැගිරෙව්වෝය. අහස ශබ්දයක් නික්මවිය. ඔබගේ ඊගස්ද විහිද ගියේය. ඔබගේ ගර්ජනා ශබ්දයද සුළි සුළඟෙහි විය. විදුලිද ලෝකය ආලෝක කෙළේය. පොළොව සෙලවී කම්පා වූවාය" (ගීතාවලිය 77:17-18) යයි ඔහු ලියයි. දෙවියන්වහන්සේට වඩා විශාල කිසිවක් මේ ලෝකයේ නැත. උන්වහන්සේ සියල්ල පාලනය කරමින් සිටින සේක.

බලාපොරොත්තු දියවී යමින් ඒවායින් මිදීමට මඟක් නොමැති බව පෙනන අවස්ථාවල අපගේ විශ්වාසය දෙවියන්වහන්සේ කෙරෙහි තබා ගනිමින් උන්වහන්සේ කෙරෙහි ඉලක්කය තබා ගත යුතුය. අප මුදවා ගැනීම පිණිස උන්වහන්සේ කළ හැකි සියල්ල කළ සේක. ඕනෑම ගැටළුවකට වඩා උන්වහන්සේ බලවත්ය. අප අපේක්ෂා කරන ආකාරයට හෝ අප අපේක්ෂා කරන කාලයට උන්වහන්සේ පිළිතුරු නොදීමට පුළුවන. නමුත් උන්වහන්සේගේ සැලැස්ම පරිපූර්ණ බව අප විශ්වාස කළ යුතුය. දෙවියන්වහන්සේ කුමක් කරනු

ඇතිදැයි අපට සිතා ගැනීමට නොහැකිය. නමුත් උන්වහන්සේ කුමන දෙයක් කළද ඒ අපගේ යහපත උදෙසා හොඳම දෙය බව අපට විශ්වාස කළ හැකිය.

**අප කෙරෙහි වන දෙවියන්වහන්සේගේ චරිතය** සහ ආකල්පය ආසාප් අවසාන වරට වටහා ගත් සත්‍යය, ස්වාමින්වහන්සේ උන්වහන්සේගේ සෙනඟගේ බැටළු එඬේරාණන් බවය. "ඔබ මෝසෙස් සහ ආරොන් ලවා බැටළු රැළක් මෙන් ඔබගේ සෙනඟ ගෙනගිය සේක" (ගීතාවලිය 77:20) යයි ඔහු ලියා ඇත. දෙවියන්වහන්සේ ස්වකීය සෙනඟ මිසරයේ වහල්කමින් මුදාගෙන "රැළක් මෙන්" ගෙන ගිය අවස්ථාව ආසාප් සිහිපත් කරන්නේය. උන්වහන්සේ සෙනඟ පිටතට ගෙන එන පිණිස හා අවසානයේ ඔවුන්ට වෙන් කරන ලද දේශය වෙත රැගෙන යන පිණිස උන්වහන්සේ මෝසෙස් සහ ආරොන් බැටළු එඬේරුන් ලෙස භාවිතා කළ සේක.

දෙවියන්වහන්සේ අපගේ බැටළු එඬේරාණන්ය යන ප්‍රතිරූපය අප කල්පනාවට ගත යුතු ශ්‍රේෂ්ඨ අදහසකි. බැටළු එඬේරුන් සැමවිටම බැටළුවන් සමගම සිටිති. තම බැටළුවන්ට අවශ්‍ය මොනවාදැයි ඔව්හු දනිති. එසේම ඔවුන්ට ආරක්ෂාවද සපයන්නෝය. භයානක ස්ථානවලින් බැටළුවන් ගෙන යන විට එක බැටළුවෙකු හෝ නැති නොවීමට ඔව්හු වගබලා ගනිති. බැටළුවන් සියයට සියයක් එඬේරුන් කෙරෙහි විශ්වාසය තබා සිටින්නෝය.

අපද දෙවියන්වහන්සේ පිළිබඳව සිතිය යුත්තේ ඒ ආකාරයටය. අපි බැටළුවන් වන්නෙමු. උන්වහන්සේ අපගේ එඬේරාණෝය. අපගේ දුෂ්කරතා මධ්‍යයේ වුවද : "ස්වාමින්වහන්සේ මාගේ එඬේරාය ; මට හිඟයක් නොවන්නේය"යි පැවසීමට අපට පුළුවන (ගීතාවලිය 23:1). ඒ මන්ද? උන්වහන්සේ කිසිසේත් අපගෙන් අහක්ව නොයන අතර කිසි අන්දමකින්වත් අපව අත් නොහරින බැවිනි (හෙබ්‍රෙව් 13:5).

තමා යහපත් බැටළු එඬේරාණන් බව යේසුස්වහන්සේද පැවසූ සේක. උන්වහන්සේගේ බැටළුවන් (අප) සමග ඇති සම්බන්ධතාව මෙසේ විස්තර කළ සේක.

*"මම යහපත් බැටළු එඬේරාය. පියාණන්වහන්සේ මා අඳුනන්නාක් මෙන්ද මා පියාණන්වහන්සේ අඳුනන්නාක් මෙන්ද මම මාගේ බැටළුවන් අඳුනමි මාගේ බැටළුවෝද මා අඳුනති. බැටළුවන් උදෙසා මාගේ ප්‍රාණය දෙමි.*

*ඔව්හු මාගේ හඬ අසන්නෝය. එසේ එක රැළක්ද එක එඬේරෙක්ද වන්නාහ. මා විසින් නැවත ගන්නා පිණිස මාගේ ප්‍රාණය දෙන බැවින් මාගේ පියාණන්වහන්සේ මට ප්‍රේම කරන සේක. කිසිවෙක් ඒක මාගෙන් උදුරාගන්නවා නොව මමම ඒක දෙමි. ඒක දෙන්ට මට බලය තිබේ. නැවත ගන්ටද මට බලය තිබේ. මේ ආඥාව මාගේ පියාණන්වහන්සේගෙන් ලදිමියි කී සේක"* (යොහාන් 10:14-18).

දෙවියන්වහන්සේ නිශ්ශබ්ද යයි සිතෙන ඕනෑම අවස්ථාවක, උන්වහන්සේ අපගේ බැටළු එඬේරාණන් බව අප මතකයට නගා ගත යුතුය. අප නොදැන සිටින නමුත් අප නිරන්තරයෙන්ම උන්වහන්සේගේ රැකවරණය යටතේ සිටින්නෙමු. දෙවියන්වහන්සේ සැමවිටම උන්වහන්සේගේ බැටළුවන් ආරක්ෂා කරන සේක. අපව දෙවියන්වහන්සේගේ "ගාලට" නැවත ගෙන එන පිණිස යේසුස්වහන්සේ වන යහපත් බැටළු එඬේරාණෝ අප උදෙසා මැරී (යොහාන් 10:14) නැවත නැගිටුණු සේක (18 වන පදය). අප කුමන පරීක්ෂාවන්ට මුහුණ දුන්නද උන්වහන්සේ අප අත් නොහරින සේක. අපි උන්වහන්සේට අයිති වෙමු.

ඔබ යාච්ඤාවෙන් හෝ විශේෂිත අභියෝගයකට මුහුණ දෙමින් සිටී නම් හා දෙවියන්වහන්සේ ඔබට පිළිතුරු නොදෙන බව හැඟී යන්නේ නම් සභා නායකයෙකුට හෝ වෙනත් කිතුණුවකු සමග ඔබගේ ගැටළුව පවසන්න. ඔවුන්ට ඔබව ධෛර්යමත් කිරීමට හා ඔබ සමග දෙවියන්වහන්සේට කථා කිරීමට පුළුවන්කම ලැබෙනු ඇත.

*Why Doesn't God Answer Me?* - Sinhala Language

උපුටාගත් බයිබල් පාඨ: © ශ්‍රී ලංකා බයිබල් සමාගම,
1995 සංශෝධිත පැරණි අනුවාදය.

Translator : Chrishanthi Perera
Editor : Kanthie Wijeyesekera

@ 2017 Our Daily Bread Ministries, All rights reserved.